සමාජයේ චින්තනය ශිෂ්ට සම්පන්න ලෙසින් හැඩගැස්වීමට එම සමාජයේ භාවිතා වන භාෂාවට ඇති බලයත්, එම භාෂාව සමාජගත කිරීමේදී මාධ්‍ය අත ඇති වගකීමත් අප විසින් නැවත නැවතත් අවධානයට ලක් කොට ඇත. මෙම ශිෂ්ට සම්පන්න චින්තනයක් සඳහා ශිෂ්ට සම්පන්න භාෂාවක් යන විෂයෙහිදී, අප විසින් භාවිතා කරන, මාධ්‍ය මගින් නැවත නැවතත් සමාජගත කරන ඇතැම් යෙදුම් කෙතරම් යෝග්‍ය වන්නේදැයි සලකා බැලීමට සිදුවේ.

ඊට උදාහරණ ලෙස "කුඩ්ඩා", "මත්ලෝලියා", "කුඩුලෝලියා" වැනි යෙදුම් දැක්විය හැක.

කුඩ්ඩා වැනි යෙදුමක් හා බැඳි ප්‍රබල සමාජ ගර්හාවක්, කොන් කිරීමේ හැඟීමක් ඇති බව අපට පිටුදැකිය හැකි නොවේ. මත්ද්‍රව්‍ය භාවිතා කරන්නෙකු/ඇබ්බැහි වූවෙකු කුඩ්ඩා වැනි යෙදුමකින් හැඳින්වීම ඔස්සේ ඔවුන් තවදුරටත් ගර්හාවට හා කොන් කිරීමකට ලක් කෙරෙනු පමණක් නොව, ඒ ඔස්සේ පුනරුත්ථාපනයකින් හෝ ඔවුන්ට නැවතත් සමාජයට ප්‍රවේශ වීම ඇවිරීමක්ද සිදු නොවන්නේද?

එසේම මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ කරුණු ගණනාවක එකතුවක් මිස, හුදු මත්ද්‍රව්‍ය උදෙසා ලෝලත්වයක් දැක්වීමක් නොවේ. එසේ නම්, මත්ලෝලියා, කුඩුලෝලියා වැනි යෙදුම් අයෝග්‍ය නොවන්නේද?

වඩාත් ශිෂ්ට සම්පන්න චින්තනයක් සමාජය තුළ හැඩගැස්වීම උදෙසා මාධ්‍යයේ ආචාර ධාර්මික වගකීම වන්නේ උක්තාකාරයේ යෙදුම් භාවිතයෙන් වැළකීම සහ ඒ වෙනුවට "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්", "මතට ඇබ්බැහි වූවන්" යනාදී වඩාත් යෝග්‍ය යෙදුම් යොදාගැනීම නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Lankadeepa